


# දුරු රට හැදුණත් ඔබ ලක් දියණී

ශ්‍රී ලංකාවේ සිංහල විෂයය පිළිබඳව ප්‍රථම මහාචාර්යයවරියයි, ඇය. කලෙක පේරාදෙණිය විශ්ව විද්‍යාලයයේ කථිකාචාර්යවරියක වූවාය ඇය. තවත් කලෙක කොළඹ විශ්ව විද්‍යාලයයේ සිංහල අංශයේ අංශයාධිපතිනිය වූවාය ඇය. පසු කලෙක කොළඹ විශ්ව විද්‍යාලයේම පශ්චාත් උපාධි පීඨයේ පීඨාධිපතිනිය ද, වැඩ බලන කුලපතිනිය ද වූවාය ඇය.

ඇය කුසුමා කරුණාරත්න මහාචාර්යතුමියයි.

පේරාදෙණිය විශ්ව විද්‍යාලයයේ විද්‍යාර්-ථියක වශයෙන් ප්‍රථම පන්තියේ ගෞරව උපාධියකින් සිය ප්‍රථම උපාධිය සම්පූර්ණ කරමින් ද සාමාජයීය සාහිත්‍ය අධ්‍යයනය සඳහා එංගලන්තයේ එසෙක්ස් (ESSEX) විශ්ව විද්‍යාලයයේ ශාස්ත්‍රපති උපාධිය ලබා ගනිමින් ද පසු කලෙක Dlitt ශාස්ත්‍රශූරී ගෞරව ආචාර්ය උපාධිය ලබා ගනිමින් ද සිය අධ්‍යාපනික හා වෘත්තීය මං පෙතෙහි ඉදිරියටම පියනැගුවාය ඈ. වසර 42 ක සිය වෘත්තීය දිවියෙහි අවසානයේ දිවි ඇති තුරාම පවතින සේ පිදෙන සම්මානිත මහාචාර්ය තනතුරින්ද (Professor Emeritus) පිදුම් ලැබුවාය ඈ.



සිය වෘත්තීය ජීවිතයෙන් ජාත්‍යන්තරයට ද පිවිසෙමින් ජපන් සාහිත්‍යය සහ සංස්කෘතිය වෙනුවෙන් කළා වූ වසර 38 ක මෙහෙවර වෙනුවෙන් සිවිල් පුරවැසියෙකු වෙනුවෙන් කවර රටකින් හෝ පිරිනැමෙන ඉහළම ගෞරව සම්මානයක් වන THE ORDER OF THE RISING SUN GOLD RAYS WITH NECH RIBBON සම්මානයෙන් ද ජපන් අධිරාජ්‍යයා වෙතින් පිදුම් ලැබුවාය ඈ.

සිය දරු මුණුපුරන්, නෑ හිතවතුන් දැක්මට පසුගියදා මෙල්බර්න් නුවරට පැමිණි ඇය සමඟින් කෙටි පිළිසඳරක යෙදීමට වරම් ලැබුවෙමු, අපි.

“ඇත්තටම අපි මේ ගමන ආවෙ අපේ දෙවැනි මිණිපිරිය බලන්න. අපේ පුතා දැන් ඉන්නේ මෙල්බර්න්වලනේ. ඒ ඇරෙන්න අපේ නෑ හිතවතුන්, ගෝල බාලයින් එහෙමත් හරියට ඉන්නවා මෙහේ.”

ඇය ‘අපි’ යනුවෙන් සඳහන් කළේ දයාබර සැමියාණන් වූ සමරජීව කරුණාරත්න මහාචාර්යතුමාව. වැඩිදෙනෙකු එතුමාව හඳුන්වන්නේ මහාචාර්ය සෑම් කරුණාරත්න ලෙසින්. මොරටුව විශ්ව විද්‍යාලයයේ උපකුලපතිවරයා වශයෙන් සේවය කර විශ්‍රාම ගිය එතුමා අද ලංකාවේ විශාලතම තොරතුරු තාක්ෂණ ආයතනය වන මාලඹේ Sri Lanka Institute of Information Technology (SLITT) හි කුලපතිවරයායි.

“අපේ පුතාටත් ඒ දුවටත් මුලින්ම දුවක් ලැබුණ වෙලාවෙ අපට ඒ අය එක්ක එකතු වෙන්න බැරිවුණා. ඉතින් ඒ අය මෙහෙ ඉඳිද්දි ලංකාවෙ හිටපු මට මහා දුකක් ඇතිවුණා. දරුවෙකුට සීයා, අත්තම්මා කියන්නේ විශාල සම්පත්. ඒ අය ඇසුරෙ මුණුපුරෙකුට, මිණිපිරියෙකුට හැදෙන්න ලැබෙනවා නම් මොනතරම් අපේ දේවල් ඒ අයට ලැබෙනවද?

**දුරු රට හැදුණත් ඔබ ලක් දියණී**
**දුරු රට වැඩුණත් ඔබ ලක් දියණී**
**දුරු රට සිටියත් ඔබ ලක් දියණී**
**නිරතුරු ඔබ අපේ සුරතල් දියණී**
**ගැමුණු කුමරු ගැන තොරතුරු තාත්තා කියා දෙයි**
**විහාර මහා දේවිය ගැන අම්මා කියා දෙයි**
**කැංගරු දේශය දියණිය නුඹගෙන් දිදුලයි**
**සිංහල ලේ වල තිබෙනා බල මහිමයටයි**
**පුංචි පාසැලේ ඉන්නා පුංචි යෙහෙළියෝ**
**පුංචි දූගේ අත්තම්මා කොයිද අසයිදෝ ?**
**පුංචි දිවයිනක් තිබේය මුතු ඇටයක් සේ**
**පුංචි වුණත් එය අගේය මහඟු මිණක් සේ**
**හඳහාමිගෙ වගතුග ගැන දූට කියා දෙන්න**
**රන්කැටියට කිරි පැණිගෙන දූ ළඟටම එන්න**
**අමල් බිසෝ දොර නෑරියෙ මන්ද කියා දෙන්න**
**අත්තම්මා බලන් ඉන්න බව සිහිකරගන්න**
**කෝං පිට්ටු සෙල්ලම් බත් කොතන ඉදෙයිදෝ ?**
**අතුරු මිතුරු දඹදිවතුරු සතුට ගෙනෙයිදෝ ?**
**පංචි පෙතයි ඔළිඳ පෝරු දූට කොයින්දෝ ?**
**අතක පතක සවර සිරින් මතක තියෙයිදෝ ?**

”මහාචාර්යතුමිය පැවසුවේ හැඟීම්බරව.

“ඉතින් මට හිතුණා විදේශයක ඉන්න මගේ ඒ මිණිපිරිය වෙනුවෙන් පද ටිකක් ගොතන්න. නොදැනීම වගේ ඒ වෙලාවෙ හිතේ තිබුණ දේවල් ලියවුණා. ජගත් වික්‍රමසිංහ දක්ෂ තරුණ සංගීතවේදියා තමයි ගීතය සංගීතවත් කළේ. දමයන්ති ජයසූරිය ශිල්පිනිය තමයි ගායනා කළේ. දැනට මේ ගීතය ලංකාවේ මාධ්‍යවල ප්‍රචාරය වෙන ගීතයක්.”

මේ මව්බිමේ මහාචාර්යයවරියක අතින් ලියැවී ශිල්පිනියක මුවින් ගැයුණ ප්‍රථම ගී පද නිබන්ධනයයි. මේ මව්බිමේ සිංහල විෂයය පිළිබඳව ප්‍රථම මහාචාර්යයවරිය ගේය පද රචිකාවක බවට පත් කළ ප්‍රථම ගී පද නිබන්ධනයයි. මෙය ලියවුණේ ඕස්ට්‍රේලියාවේ අප අතර වෙසෙන සිඟිත්තියක වෙනුවෙන්. ඒ නිසාවෙනි නව වසරේ ප්‍රථම “ගී සඳළුව” ඒ වෙනුවෙන් විවෘත වන්නේ. ඒ සඳහා කාලය වෙන් කිරීම වෙනුවෙන් තුති පුදන්නෙමු එතුමියට.

මහාචාර්යයතුමියගේ සැමියා වන සෑම් කරුණාරත්න මහාචාර්යයවරයාගේ කණිටු සොයුරු රෝහණ කරුණාරත්න සහෘදයා ය අපගේ බලවත් උනන්දුව මත ඔවුන් හා අපව සම්බන්ධීකරණය කළේ. ඒ වෙනුවෙන්ද කෘතවේදී වන්නෙමු අපි.

සැමට සුභ නව වසරක් !

සිසිර දිසානායක




